සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 - 2024

## නර්තනය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I කොටස

- සියලුම ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර සපයන්න.
- අංක 01 - 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. "තෙයියත් තෙයිතා තිත් තෙයි තත් තා" යන පා සරඹ පදය අයත් වන්නේ,
    1) එකළොස්වන සරඹයටය 2) නවවන සරඹයටය
    3) දොළොස්වන සරඹයටය 4) දහවන සරඹයටය
02. ගොඩ සරඹවල අර්ධ චක්‍ර සරඹය යනුවෙන් හඳුන්වන්නේ,
    1) හයවන සරඹය 2) අටවන සරඹය 3) හත්වන සරඹය 4) නවවන සරඹය
03. "දොදොම්ත තකු දොම්" යන බෙර පදය අයත් වන්නම වන්නේ,
    1) සිංහරාජ වන්නම 2) තුරඟා වන්නම 3) වෛරොඩි වන්නම 4) හනුමා වන්නම
04. "එපා කියන තැන තැන නොසිටිල්ලා" මෙම කවි පදය අයත් ගැමි නැටුම වන්නේ,
    1) පන් නෙලීමේ කවි 2) චාමර කවි 3) සොකරි කවි 4) ගොයම් කවි
05. ගැටබෙර වාදනයේදී "ජිත්" අක්ෂරය සහ "නං" අක්ෂරය වාදනය කෙරෙනුයේ,
    1) වම් ඇස සහ දකුණු ඇස 2) වම් ඇස
    3) දකුණු ඇස 4) දකුණු හා වම් ඇස
06. ගැටබෙරයෙන් වාදනය වන "තකට කුදට" යන බෙර සරඹය,
    1) පළමුවන සරඹය 2) දෙවන සරඹය 3) තුන්වන සරඹය 4) හතරවන සරඹය
07. මද්දල බෙර නාදයට අනුව නළඟනන් රැඟුමන් ඉදිරිපත් කර ඇති ආකාරය විස්තර කෙරෙන සංදේශ කාව්‍ය,
    1) තිසර සංදේශය 2) සැළලිහිණි සංදේශය 3) පරවි සංදේශය 4) හංස සංදේශය
08. "තකට දොදොම් තා".... යනු,
    1) සීරුමාරුවකි 2) කස්තිරමකි 3) අඩව්වකි 4) බෙර පදයකි
09. කරුණා රසයට මුල් වන්නා වූ ස්ථායි භාවය වන්නේ,
    1) හය 2) ශෝක 3) උත්සාහ 4) විශ්මය
10. ස්වස්ථාව කෙරෙහි බලපාන ප්‍රධාන සාධක,
    1) තුනකි 2) හතරකි 3) එකකි 4) දෙකකි

- වරහනෙන් තෝරා හිස්තැනට ගැලපෙන පිළිතුර ලියන්න.

(දෙඹින පද, බුම්මැඩිය, කොරවක්ගල, දෙගුණ, පොළොන්නරු)

11. ............................................. අනුරාධපුර යුගයට අයත් ලෙන් ලිපියක් ලෙස සැලකේ.
12. දේවදාසීන් හත්දෙනෙකු පුද ලැබුවේ ............................................. යුගයේදී ය.
13. උඩරට ගොඩ සරඹ නම් සබරගමු ............................................. වේ.
14. ............................................. ත්‍රිවිධ ලයෙහි කොටසකි.
15. ගොයම් නැටුමේ දී ............................................. භාවිතා වේ.

- **අංක 16 -20 දක්වා ප්‍රශ්නවලට ප්‍රහේලිකාව තුළින් පිළිතුරු සපයන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| 16<br>කො<br>19 | | | | 20<br>වි | |
| | | | | | |
| 17 | | | | | |
| | | | | | |
| | 18 | | | ත | |

<u>හරහට</u>

16. උඩරට ප්‍රධාන ශාන්තිකර්මයේ පුද ලබන දෙවියෝ ය.
17. ගැටබෙරයේ වරපට සකස් කිරීම සඳහා සම් ලබා ගන්නා සත්වයා වේ.
18. ගොයම් නැටුම් සඳහා භාවිතා වන උපකරණයකි.

<u>පහළට</u>

19. බෙර වර්ග සෑදීම සඳහා දැව ලබා ගන්නා ගසකි.
20. ශෝකී භාවයට හේතුවන කරුණකි.

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01. නර්තනයේ මූලික අංගහාර සකස් කර ගැනීම සඳහා පා සරඹ හා ගොඩ සරඹ උපකාරී වේ.

   1. 10 වෙනි පා සරඹයේ සරඹ නාමය ලියන්න. (ල = 02)
   2. 11 වෙනි පා සරඹයේ සරඹ පදය ලියා දක්වන්න. (ල = 02)
   3. ගොඩ සරඹ 7, 8, 9 සරඹ නාමයන් ලියන්න. (ල = 03)
   4. 8 වන ගොඩ සරඹයේ කස්තිරම ලියන්න (ල = 03)

02. ගායනය, වාදනය, මෙන්ම නර්තනය ද තාලය මත රඳා පවතී.

   1. මැඳුම් තනි තිතට අයත් කස්තිරමක් ලියා දක්වන්න. (ල = 05)
   2. සිංහරාජ වන්නමේ බෙරපදය සහ තානම ප්‍රස්තාර කරන්න. (ල = 05)

03. උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ගැටබෙරය වේ.

   1. ගැටබෙරයේ දිග සහ මුහුණතෙහි විෂ්කම්භය ලියන්න. (ල = 02)
   2. ගැටබෙරය වාදනය කරන අවස්ථා තුනක් නම් කරන්න. (ල = 03)
   3. ගැටබෙරයේ රූප සටහනක් ඇඳ කොටස් තුනක් නම් කරන්න. (ල = 2+ 3 = 05)

04. යුග ඇසුරින් නර්තන කලාවේ ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කළ හැක.

1. සෙල්ලිපි හා සංදේශ කාව්‍ය ඇතුළත් යුග දෙකක් නම් කරන්න. (ල = 02)
2. ඔබ උගත් එක් යුගයකට අයත් සංදේශ කාව්‍ය දෙකක් නම් කරන්න (ල = 02)
3. එම සංදේශ කාව්‍ය ඇසුරු කරගනිමින් නර්තනය පැවති බවට සඳහන් වන කරුණු 3 ක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ල = 06)

05. සරළ රංග උපකරණ නිර්මාණයෙන් සිසුවා ප්‍රායෝගික කුසලතා සංවර්ධනය කර ගනියි.

1. ඔබ පන්තිකාමරයේදී නිර්මාණය කරන ලද රංග උපකරණයක් නම් කරන්න. (ල = 02)
2. ඔබ නම් කරන ලද රංග උපකරණය නිර්මාණය නිර්මාණයට යොදාගත් අමුද්‍රව්‍ය දෙකක් නම් කරන්න. (ල = 02)
3. පන්තිකාමරය තුල රංග උපකරණය නිර්මාණය කිරීමේදී ඔබ ලබා ගත් අත්දැකීම් තුනක් ලියන්න (ල = 06)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 - 2024

## නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය

නම / විභාග අංකයඃ

01. i. කැමති ගායනය
    ii. නම් කරන ලද ගායනය
    iii. මාත්‍රා 2+3/ 3+3 තාල රූපයට අයත් බෙර පදයක් තාල තබා කීම
    iv. ඔබ උගත් බෙර සරඹයක් වාදනය කරන්න
    v. 2+2/ 3+3/ 4+4/ යන තිත් වලට අයත් ඔබ කැමති බෙර පදයක් වාදනය කරන්න.

(ල = 2 x 5 =10)

02. i. ගුරුවරයා විසින් නම් කරන ලද පා සරඹයක් හමාර පදය සමග නර්තනය කරන්න (ල = 5)
    ii. ඔබ උගත් ගොඩ සරඹ අතරින් කැමති එක් සරඹයක් කස්තිරම සමග නර්තනය කරන්න (ල = 5)

03. වෛරොඩි හෝ සිංහරාජ වන්නම නර්තනය කරන්න (ල = 10)

04. ඔබ උගත් ගැමි නැටුමක කවි දෙකක් ගයමින් නර්තනය කරන්න (ල = 10)

05. මුව පැටවකු තම මව සමඟ ඉතා සතුටින් නටමින් සිටියි. හදිසියේම මුව පැටවා උගුලකට අසුවේ.
(චරිතය වැළපෙන මුව දෙන) (ල = 10)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 - 2024

# නර්තනය - පිළිතුරු පත්‍රය

නම / විභාග අංකය:

## I කොටස

01. 4
02. 2
03. 1
04. 4
05. 3
06. 2
07. 3
08. 1
09. 2
10. 4
11. කොරවක්ගල ලෙන් ලිපිය
12. පොළොන්නරු යුගය
13. දොඹින පද
14. දෙගුණ
15. බුම්මැඩිය
16. කොහොඹාදෙවියෝ
17. ගවයා
18. දෑකැත්ත
19. කොස් ගස
20. වියෝව / විරහ

(ල 1 x 20 = 20)

## II කොටස

01. i) 10 වන පා සරඹ නාමය : තුන් පැති අඩිය (ල. 02)

ii) 11 වන පා සරඹ පදය : තෙයිත තෙයිත තෙයි තෙයියත් තාම් (ල. 02)

iii) 7 : අංගහාර සරඹය
8 : අර්ධ චක්‍ර සරඹය
9 : දෑත පැගීමේ සරඹය (ල. 03)

iv) කස්තිරම :
රුංතක ජිංතක තරිකිට කුංදත් ///
තාග්ග ජිංතක තරිකිට කුංදත් //
රුංතක ජිං ජිං //
රුංතක ජිංතක තරිකිට කුඳ කුඳ
තාග්ග ජිංතක තරිකිට කුංදත්
රුංතක ජිංතක තරිකිට කුංදත් තා. (ල. 03)

02. i) මැදුම් තනි තිතට අයත් කස්තිරම
රුඳ ගත ගත ගත කුකුදත්
ගජිංත ගත් ජිත් කුංදත්
තකුඳ ගජිං තකුඳ ගජිං
තකුඳ ගතට ගත කුඳ කුඳ
ගජිංත ගත් ජිත් කුංදත්
ජිකුතක තරිකිට කුංදත් තා (ල. 05)

ii) සිංහරාජ වන්නමේ බෙරපද සහ තානම ප්‍රස්තාරය

| | /1 | 2 | 3 | 4 | /1 | 2 | 3 | 4 | /1 | 2 | 3 | 4 | /1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය: | දො | දොං | - | ත | ත | කු | දොං | - | දො | දොං | - | ත | ත | කු | දොම් | - |
| තානම: | + | ත | නත් | ත | නෙ | න | තුම් | - | - | ද | නත් | ත | නෙ | න | තුම් | - |
| | + | ද | නත් | ත | නෙ | න | තුම් | - | - | දන | තා | - | නා | - | ත | න |
| | + | ත | නත් | ත | නෙ | න | තුම් | - | - | ද | නත් | ත | නෙ | න | තුම් | - |
| | + | ද | නත් | ත | නෙ | න | තුම් | - | - | දන | තා | - | නා | - | - | - |


(ල. 05)

03\. i) ගැටබෙරයේ දිග : තුන්වියත් තුනඟුලකි (අඟල් 27 පමණ)
මුහුණතෙහි විෂ්කම්භය : විග්ගුස්සකි. (අඟල් 7 - 8 පමණ) (ල. 02)

ii) පිරිත් පින්කම්
තේවා වාදන අවස්ථා
පෙරහැර
ශාන්තිකර්ම
උත්සව
සමාරම්භක අවස්ථා
සන්දර්ශන
තූර්ය වාදක (ල. 02)

iii) ගැට බෙරයේ රූප සටහන (ල. 03)

1. බෙර කඳ
2. බෙර පුහුල
3. කැපුම් හම
4. වම් ඇස
5. දකුණු ඇස
6. වෙනිවර කැරැල්ල
7. වරපටය
8. කන්වරය
9. කයිපුඩි වළල්ල
10. බෙර ලනුව
11. සුරත් තට්ටුව




04\. i) අනුරාධපුර යුගය
පොළොන්නරු යුගය (ල. 02)

ii) යුගය - කෝට්ටේ යුගය
සංදේශ කාව්‍ය - සැලලිහිණි සංදේශය, පරවි සංදේශය, තිසර සංදේශය (ල. 02)

iii) 1. තිසර සංදේශයෙහි වාද්‍ය භාණ්ඩ හා නර්තන අංග පිළිබඳව තොරතුරු ඉදිරිපත් කර ඇත.
2. සැලලිහිණි සංදේශයේ සැලෙන පහන් සිළු වැනි රගන ලියෝ සිටි බව සඳහන් වේ
3. පරෙවි සංදේශයේ දුටුවන්ගේ සිත පිනවන ආකාරයට අඟනන් රඟදක්වා ඇති බව සඳහන් වේ... යනාදී වශයෙන් පිළිතුරු ලියා ඇත්නම් ලකුණු හිමිවේ. (ල. 06)

05\. i) කුල්ල, දැකැත්ත, මෝල්ගස ලෙස නම් කොට ඇත්නම් ල. 02)

ii) කොළපත්, කාඩ්බෝඩ්, වර්ණ කඩදාසි, බෙලෙක් තහඩු, එස්ලෝන් බට, රෙදි ඔතන බම්බු යනාදී අදාළ අමුද්‍රව්‍ය නම් කර ඇත්නම් (ල. 02)

iii) සාමූහිකත්වය, නායකත්වය, නිර්මාණ කුසලතා වර්ධනය හසුරු කුසලතාව ආදී වශයෙන් සිසුවා ලැබූ කුමන හෝ අත්දැකීමක් ලියා ඇත්නම්. (ල. 06)